# 12. ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය සහ ප්‍රතිපත්ති

- ❖ නිදහසෙන් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ සිදු වූ වෙනස්කම් පිළිබඳ විමර්ශනය.
- ❖ ශ්‍රී ලංකා ආර්ථිකයේ නව ප්‍රවණතා පිළිබඳ ගවේෂණය.
- ❖ සමකාලීන ආර්ථික සිදුවීම් සහ ප්‍රතිපත්ති.

## නිදහසෙන් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ සිදු වූ වෙනස්කම්

නිදහසින් පසු ආර්ථික ලක්ෂණ අනුව අවධි කිහිපයක් හඳුනා ගත හැකිය.

1. 1948 - 1960 දක්වා අවධිය
2. 1961 -1977 දක්වා අවධිය
3. 1977 -1994 දක්වා අවධිය
4. 1994 -2015 දක්වා අවධිය

### 1. 1948 - 1960 දක්වා අවධියේ ප්‍රධාන ලක්ෂණ

- යටත් විජිත යුගයේ පැවති ලක්ෂණ සුලු වෙනස්කම් සහිතව ක්‍රියාත්මක වීම.
- ලෝක බැංකු බලපෑම ප්‍රථම වරට ආර්ථිකය මත පතිත වීම.

- ආර්ථික සංවර්ධනයේ උපාය මාර්ගයක් ලෙස කෘෂිකර්මයට හා කර්මාන්තවලට ප්‍රබල තැනක් ලබා දීම.
- යැපුම් කෘෂිකර්මාන්තය හා ගොවි ජනපද ව්‍යාපාරය ප්‍රගතියක් ඇති වීම.
- ගෙවුම් ශේෂ අර්බුද ආරම්භ වීම.
- ආර්ථික ක්‍රම සම්පාදනය සහ සැලසුම් සම්පාදනය ආරම්භ වීම.
- අර්ධ විවෘත ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය.
- පුළුල් ශුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක වීම.
- ජනසතු ව්‍යාපාර ආරම්භ වීම.

## 2. 1961 - 1977 අවධියේ ශ්‍රී ලංකා ආර්ථිකයේ ලක්ෂණ

- අභ්‍යන්තරාභිමුඛ ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම.
- විනිමය පාලනය , ද්විත්ව විනිමය අනුපාත ක්‍රමය ක්‍රියාත්මක වීම.
- ආනයන පාලනය.
- විදේශ විනිමය අර්බුද ඇති වීම.
- ආනයන ආදේශන කාර්මික ප්‍රතිපත්ති ආරම්භ වීම.
- අපනයන විවිධාංගිකරණය.
- රාජ්‍ය අංශයේ මහා පරිමාණ කර්මාන්ත ආරම්භ වීම.
- දේපළ හා වත්කම් ප්‍රතිසංස්කරණය
- විනිමය අනුපාත ප්‍රතිසංස්කරණය

## 3. 1978 - 1994 අවධියේ ශ්‍රී ලංකා ආර්ථිකයේ ලක්ෂණ

- අපනයන අභිමුඛ කාර්මික ප්‍රතිපත්ති ක්‍රියාකාරීත්වය
- ඒකීය විනිමය අනුපාත ක්‍රමයක් ඇති වීම.
- ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයක් ඉවත් ඇති කොට පාවෙන විනිමය අනුපාත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
- විනිමය පාලනය හා ආනයන පාලනය ඉවත් කිරීම.
- පාලන ප්‍රතිපත්ති ඉවත් කොට ඉල්ලුම් හා සැපයුම් බලවේග ඔස්සේ ක්‍රියාත්මක වන මිල ක්‍රමයකට ඉඩ සැලසීම.
- ශුභසාධන ප්‍රතිපත්ති සීමා කිරීම.
- ආර්ථිකය විවෘත කිරීම.
- ආයෝජන ප්‍රවර්ධන කලාප පිහිටුවීම.
- පෞද්ගලිකකරණය, ප්‍රතිව්‍යුහගතකරණය වැනි සැලසුම් පාර්ශවීය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- දරිද්‍රතාව අවම කිරීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

4. 1994 - 2015 අවධියේ ශ්‍රී ලංකා ආර්ථිකයේ ලක්ෂණ

- දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ ප්‍රතිසංස්කරණ ඔස්සේ විවෘත ආර්ථික ප්‍රතිපත්ති තවදුරටත් ක්‍රියාත්මක වීම.
- විදේශ ආයෝජන සීමා වීම.
- උතුරු නැගෙනහිර යුද්ධය අවසන් කිරීමට විශාල වියදමක් දැරීම.
- යටිතල පහසුකම් සංවර්ධනය.
- විදේශ ණය කෙරෙහි විශාල වශයෙන් යොමු වීම.
- දේශීය කෘෂිකර්මාන්ත හා ඉදිකිරීම් කර්මාන්ත කෙරෙහි පුළුල් රාජ්‍ය අනුග්‍රහය දැක්වීම.

# ආනයන ආදේශන කාර්මීකරණය.

## ❖ ආනයන ආදේශන කාර්මීකරණය.

ආනයන ආදේශන කාර්මීකරණය යනු, විදේශ රටවලින් ආනයනය කරනු ලබන භාණ්ඩ සඳහා සීමා පනවමින්, එම භාණ්ඩ දේශීයව නිෂ්පාදනය කර, දේශීය කර්මාන්ත දිරිගැන්වීමේ පසුබිම් සකස් කිරීමයි.

පළමුව සුඛෝපභෝගී භාණ්ඩ හා අත්‍යවශ්‍ය නොවන භාණ්ඩත් දෙවනුව අත්‍යවශ්‍ය භාණ්ඩ (හාල්, මිරිස්, ලූණු) ආනයනය සීමා කරමින් වෙළඳපල අතරමැදියන් ලැබෙන වාසි ලබන වාසි සීමා කරන ලදී .

**ආනයන ආදේශන කාර්මීකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම මගින් ළඟා කර ගැනීමටකර ගැනීමට අපේක්ෂා කළ අරමුණු.**

- දේශීය සම්පත් උපයෝජනය ඉහළ නැංවීම.
- රැකියා අවස්ථා බිහි කිරීම.
- විදේශ වෙළෙඳපොළ මත රැඳීම අඩු කිරීම.
- විදේශ විනිමය පිටරටට ඇදී යාම වැළැක්වීම.
- ආර්ථික වර්ධනය වේගවත් කිරීම.
- ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.
- යටිතල පහසුකම් සංවර්ධනය.

## රජය විසින් ආනයන ආදේශන කාර්මීකරණ ප්‍රතිපත්තිය සාර්ථක කරගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග.

- බදු විරාම හා බදු සහන සැපයීම.
- සහනදායී කොන්දේසි යටතේ ණය සැපයීම.
- සානුබල සැපයීම.
- විදේශ ආයෝජන සඳහා අවසර දීමේ දී ආනයන ආදේශන කර්මාන්ත වලට ප්‍රමුඛත්වය ලබාදීම.

## ආනයන ආදේශන ප්‍රතිපත්ති ආර්ථිකයට බලපාන ආකාරය/ ආනයන ආදේශන ප්‍රතිපත්තියේ වාසි.

### ❖ ධනාත්මක බලපෑම / වාසි.

- සුඛෝපභෝගී භාණ්ඩ සහ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය සීමා කර එම භාණ්ඩ දේශීය වශයෙන් නිෂ්පාදනය දිරිමත් කිරීම හරහා විදේශ විනිමය අර්බුදය හා ගෙවුම් ශේෂ ගැටලු වලට විසඳුම් ලබා දීම.
- අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයන සීමා කළ අතර, එම භාණ්ඩ දේශීය නිෂ්පාදනයට හා අභ්‍යන්තර හුවමාරු කිරීම මගින් වෙළෙඳපොළ අතරමැදියන් ලබන වාසි සීමා කිරීම.
- ආනයන ආදේශන කෘෂි නිෂ්පාදිතයන් (ලූණු, මිරිස්, කව්පි, සෝයා, මුංඇට ,කුරහන්) හා ආනයන ආදේශන කර්මාන්ත (සබන් ,සුවඳ විලවුන් ,රෙදිපිළි හා ඇගලුම්, බෙහෙත් ) වැනි පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය දේශීය වශයෙන් දිරිගැන්වීම.
- බදු විරාම සහ බදු සහන ලැබෙන නිසා දේශීය වෙළඳපොළ තුළ භාණ්ඩවල මිල අඩු කළ හැකි වීම
- රැකියා අවස්ථා ජනනය වීම නිසා ආදායම් බෙදීයාමේ බෙදීයාමේ විෂමතාවය අඩු වීම.

### ❖ සෘණාත්මක බලපෑම /අවාසි.

- රාජ්‍ය ව්‍යවසාය කළමණාකරණයේ පැවති දුර්වලතා හේතුවෙන් එම කර්මාන්ත බොහෝමයක් අකාර්යක්ෂම වී රාජ්‍ය වියදම වැඩිවීම.
- තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී නිලධාරිවාදය දැඩි ලෙස ඉස්මතු වීම.
- කර්මාන්තවල නිෂ්පාදන කටයුතු බොහෝ විට ප්‍රාග්ධන සූක්ෂම වූ නිසා අපේක්ෂිත අයුරින් සේවා නියුක්ත අවස්ථා (රැකියා) බිහි නොවීම.

- නිෂ්පාදන පිරිවැය ඉහළ මට්ටමක පැවතීම හා නිෂ්පාදන ගුණාත්මක භාවය පහල මට්ටමක පැවතීම නිසා ලෝක වෙළෙඳ පොළ කරා පිවිසීමට බාධා ඇතිවීම.
- කර්මාන්ත වල ධාරිතාවය උපරිම ලෙස භාවිතා කිරීමට අවශ්‍ය සම්පත් අඛණ්ඩව ලබා ගත නොහැකි වීම .

## අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය.

අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය යනු, ආනයනය කරන භාණ්ඩ වලට ආදේශන ලෙස දේශීය වෙළඳපොළ සඳහා භාණ්ඩ නිෂ්පාදනය කරනවා වෙනුවට විදේශ වෙළඳපල ඉලක්ක කර ගනිමින් තරගකාරීව භාණ්ඩ නිෂ්පාදනය කිරීමයි.

මෙහි දී දේශීය නිෂ්පාදනයේ දී සාපේක්ෂ වාසි පවතින භාණ්ඩ විදේශ වෙළෙඳපොළ වෙත යොමු කරනු ලබයි.

අපනයන අභිමුඛ කාරණය කරන ප්‍රතිපත්තියක ප්‍රධානතම ඉලක්කය වන්නේ, ආනයන සීමා කිරීම නොව අපනයන තරගකාරීත්වය හා අපනයන විවිධාංගිකරණය තුළින් ලෝක වෙළඳපොල තුළ තුළ සිය කොටස පුළුල් කර ගැනීමයි.

සෙසු අරමුණු වන්නේ ,

- ගෙවුම් ශේෂ ගැටලු නිරාකරණය.
- විදේශ විනිමය ගැටලු නිරාකරණය.
- ආර්ථික වර්ධන උපායමාර්ග ලෙස අපනයන කර්මාන්ත ප්‍රවර්ධනය.
- අපනයන ඉලක්ක කරගත් කර්මාන්ත වෙත විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම.
- සේවා නියුක්තිය අවස්ථා පුළුල් කිරීමට අපනයන වෙත යොමු වූ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.
- විදේශ විනිමය වෙළෙඳ පළේ ප්‍රසාරණය උදෙසා අපනයනය ප්‍රසාරණය කිරීම.

### ❖ අපනයනාභිමුඛ කාර්මීකරණය ප්‍රතිපත්තියේ මූලික ලක්ෂණ.

- නිදහස් වෙළඳාමට ඉඩ ලැබෙන පරිදි ආනයන හා අපනයන සීමාවන් ඉවත් කිරීම.
- ආනයන තීරු බදු ඉවත් කිරීම සහ ආනයන තීරු තීරුබදු ලිහිල් කිරීම තුළින් බදු සහන ලබා දීම.
- විදේශ වෙළඳපල ඉලක්ක කර ගත් ඍජු විදේශ ආයෝජන වලට ප්‍රමුඛත්වය ලබාදීම.
- ජීඑස්පී පැකේජය සහ GSP+ පැකේජය ලබා ගැනීම.
- විදේශ විනිමය සීමා ඉවත් කරමින් විදේශ විනිමය වෙළෙඳපොළ ක්‍රියාකාරකම් ලිහිල් කිරීම හා විදේශ බැංකු, මූල්‍ය ආයතන වලට රට තුළට පැමිණීමට නිදහස ලබාදීම.

අපනයනාභිමුඛ කාර්මීකරණය ප්‍රතිපත්තියෙන් ආර්ථිකයට වූ බලපෑම/ අපනයන අභිමුඛ කාරණය කරන ප්‍රතිපත්තියේ වාසි හා අවාසි.

### ❖ ධනාත්මක බලපෑම/ වාසි.

- විදේශ විනිමය උපයා ගැනීමට හැකි වීම.
- සේවා නියුක්තිය ඉහළ යාම.
- දේශීය සම්පත් උපයෝජනය වර්ධනය වීම හා ආර්ථික වෘත්තීය වේගවත් වීම.
- දියුණු තාක්ෂණය භාවිතා කිරීමට හැකි වීම.
- රාජ්‍ය ආදායම ඉහළ යාම සහ දේශීය මුදලේ අගය පිරිහීම වළක්වා ගත හැකි වීම.

### ❖ ඍණාත්මක බලපෑම/ අවාසි.

- ආර්ථිකය ලෝක වෙළෙඳපොළ මත රඳා පැවතීම සහ අපනයන භාණ්ඩ වලට ලෝක වෙළෙඳ පොළේ දී විශාල තරගයකට මුහුණ දීමට සිදුවීම.
- දේශ සෘජු ආයෝජනයන් උපයන්නන් ඔවුන්ගේ ලාභ මව් රටට රැගෙන යාම.
- ඇතැම් විදේශ වෙළඳපලවල් ආරක්ෂා කරගැනීම සඳහා විවිධ රටවල හා ආයතන වල විවිධ කොන්දේසි වලට යටත් වීමට සිදු වීම.
- අපනයන අභිමුඛ කර්මාන්ත සඳහා විශාල මුදලක් එකවර ආයෝජනය කිරීමට සිදු වීම.
- අපනයන භාණ්ඩ වල ලෝක වෙළඳ පළ උච්චාවචනය වීම රටේ ආර්ථිකයට විශාල ලෙස බලපෑම.

## ❖ ආර්ථික නිර්බාධකරණය.

නිර්බාධකරණය යනු, 1977 එක්සත් ජාතික පක්ෂ රජයක් පිහිටුවීමත් සමඟ රාජ්‍ය කේන්ද්‍රීය කරගත් සංවර්ධන ප්‍රතිපත්තිය නිමාවීමෙන් පසුව පෞද්ගලික අංශය දිරිමත් කිරීමට යොමු වූ සහ ආර්ථිකය බාධාවකින් තොරව සිදු කිරීමට යොමු වීමයි.

1977 ට පෙර ක්‍රියාත්මක කළ අභ්‍යන්තර අභිමුඛ ආර්ථික ප්‍රතිපත්තියේ අභාග්‍යසම්පන්න ප්‍රතිඵල වලටත ප්‍රතික්‍රියාවක් ලෙස 1977 දී නිර්බාධ ආර්ථික ප්‍රතිපත්තිය දියත් කළේය. දකුණු ආසියාවේ මෙවැනි වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ පළමු රට ශ්‍රී ලංකාවයි.

**නිර්බාධවාදී ආර්ථික ප්‍රතිපත්තියේ මූලික අරමුණ වූයේ ,**

කාර්මීකරණය තුළින් ආර්ථික වර්ධනය වේගවත් කිරීමත්, අපනයන ප්‍රවර්ධනය තුළින් විදේශ විනිමය අර්බුදය විසඳීමත් ය.

### ❖ නිර්බාධකරණ ප්‍රතිපත්තියේ මූලික ලක්ෂණ.

- ආනයන වෙළඳාම සහ විදේශ විනිමය ගනුදෙනු ලිහිල් කිරීම .
- විදේශීය ප්‍රාග්ධන ආයෝජන දිරිමත් කිරීම .
- මුදල් අවප්‍රමාණය සහ නම්‍ය විනිමය අනුපාත ක්‍රමයක් හඳුන්වා දීම .
- මිල පාලනයන් ඉවත් කිරීම .
- පෞද්ගලික අංශයේ කාර්යභාරය පුළුල් කිරීම .
- පාරිභෝගිකයින්ට සහ නිෂ්පාදකයින්ට දෙනු ලබන විවිධ සහන සැළකිය යුතු තරමින් කපාහැරීම.
- නිර්බාධකරණ ප්‍රතිපත්තියේ ආර්ථික ප්‍රතිවිපාක .
- පාවෙන පාලිත විනිමය අනුපාත ක්‍රමයක් බිහිවීම.
- ප්‍රශංසනීය වූ ආර්ථික වෘද්ධියක් හා ව්‍යුහාත්මක පරිවර්තනයක් ඇති වීම.
- 1978 - 1982 කාලය තුළ වාර්ෂික ආර්ථික වෘද්ධි අනුපාතිකය 2.9% සිට 6% දක්වා වර්ධනය වීම.)
- විරැකියා අනුපාතය පහළ වැටීම.
- ආයෝජන අනුපාතය වර්ධනය වීම .
- ශ්‍රී ලංකාව කෘෂිකාර්මික අපනයන මත යැපීම අඩු වීම.
- කාර්මික අපනයන වර්ධනය වීම.

(1985වන විට කාර්මික අපනයන 40% දක්වා ද 1995 වන විට 75% දක්වාද වර්ධනය වීම)

## ශ්‍රී ලංකා ආර්ථිකයේ නව ප්‍රවණතා පිළිබඳ ගවේෂණය.

## ➢ නිෂ්පාදනය හා එහි සිදු වූ ව්‍යුහාත්මක වෙනස්කම්

## ❖ ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය.

ආර්ථික ව්‍යුහය මගින් නිරූපණය වන්නේ සමස්ත නිශ්පාදිතය, සේවා නියුක්තිය හා විදේශ වෙළඳාම යන සාර්ව ආර්ථික විචල්‍යයන් ට කෘෂිකර්මාන්තය, කර්මාන්තය, සේවා යන අංශ දායක වී ඇති ආකාරයයි.

එබැවින් ආර්ථික ව්‍යුහය මැනිය හැකි ක්‍රම තුනකි.

1) නිෂ්පාදන ව්‍යුහය.
2) සේවා නියුක්ති ව්‍යුහය.

3) විදේශ වෙළඳාම


## ❖ නිෂ්පාදන ව්‍යුහය.

ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ව්‍යුහය මනින ලද්දේ දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික, කාර්මික, සේවා යන අංශය කරන ලද සාපේක්ෂ දායකත්වය පදනම් කරගෙනයි.

පසුගිය වසර කිහිපයක ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ව්‍යුහයෙන් සංයුතිය.

(ද.දේ. නි ප්‍රතිශතයක් ලෙස)

| ආර්ථික කටයුතු | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| කෘෂිකර්මාන්ත | 7 | 7.42 | 7.7 |
| කර්මාන්ත | 26.1 | 27.4 | 27.9 |
| සේවා | 57.4 | 58.24 | 64.4 |



| ආර්ථික කටයුතු. | වාර්ෂික වර්ධන අනුපාතය (%) | | |
|---|---|---|---|
| | **2018** | **2019** | **2020** |
| කෘෂිකාර්මික | 4.8 | 1.0 | -2.4 |
| කාර්මික | 0.9 | 2.7 | -6.9 |
| සේවා | 4.7 | 2.3 | -1.5 |
| භාණ්ඩ මත බදු (-) | -7.2 | -2.4 | -8.0 |
| **ද.දෙ. නි හි වර්ධනය** | **3.2** | **2.3** | **-3.6** |

**2019 වසරේ දී වසරේ දී ආර්ථිකයේ සියලුම අංශ ධනාත්මක වූ නමුත් මන්දගාමී වර්ධන වේගයක් වාර්තා කළේය.**

- දැඩි අහිතකර කාලගුණික තත්ත්ව මගින් විශේෂයෙන් තේ, රබර්, මුහුදු මත්ස්‍ය හා ජලජීවී වගා අංශ ඇතුළත් කෘෂිකාර්මික අංශයට බලපෑම් ඇතිවිය.
- ඉදිකිරීම් හා පතල් කැනීම් කටයුතු වල ඇති වූ පිබිදීමේ සහයෝගයද ඇතිව කර්මාන්ත අංශය 2.7% කින් වර්ධනය විය.
- නවාතැන් ආහාර පාන සේවා ක්‍රියාකාරකම් වල අඩුවීම හා තොග හා සිල්ලර වෙළදාම මන්දගාමී වීම හේතුවෙන් සේවා අංශයේ වර්ධනය 2.3% ක් දක්වා සැලකිය යුතු ලෙස පහත වැටුණි.
- 2019 වසරේ සියලුම අංශ ධනාත්මක ස්වරූපයක් ගත්තද 2020 වසරේ දී සියලුම අංශයන්හි වර්ධනය සෘණාත්මක වී ඇත. එලෙස ශ්‍රී ලංකා ආර්ථිකය පසුබෑමට ලක්ව ඇත්තේ කොවිඩ්-19 වසංගතයේ බලපෑම පිළිබිඹු කරමිනි.

➢ **කෘෂිකර්මාන්ත අංශයේ දී ,**

එළවළු වගාව, වී වගාව ඇතුළු අනෙකුත් ධාන්‍ය වගාව, සහ පලතුරු වගාව ධනාත්මක වුවද ධීවර, තේ වගාව, වන හා දැව වගාව, සත්ව නිෂ්පාදන ආදිය සැලකිය යුතු තරමින් පහත වැටිණ.

➢ **කර්මාන්ත අංශයේ දී ,**

ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදන ආදිය නිපදවීම සිදු වුවද ඉදිකිරීම්, රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදනය, සම් හා සම් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය, පතල් හා කැණීම් වැනි අංශයන්හි විශාල බලපෑමක් ඇතිවිය.

➢ **සේවා අංශයේ දී ,**

මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවා, විදුලි සංදේශ සේවා, තොග හා සිල්ලර වෙළඳාම ආදී සේවා ක්‍රියාත්මක වුවද මගී සහ භාණ්ඩ ප්‍රවාහන සේවා, ගබඩා පහසුකම් හා වෙනත් පෞද්ගලික සේවා, නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා ආදිය පසුබෑමට ලක්විය.

# සේවා නියුක්තිය

## ❖ සේවා නියුක්තිය

සේවා නියුක්ත පුද්ගලයන් යනු,

සමීක්ෂණය පවත්වන දිනට පෙර සතිය තුළ වැටුප් ලබන සේවකයින්, සේවා යෝජකයින්, තමාගේම ආර්ථික කටයුතුවල නිරත වන්නන් සහ පවුල් ආර්ථික කටයුතුවලට දායක වන්නන් සේවා නියුක්තිකයන් ලෙස සැලකේ.

### ➢ සේවා නියුක්ත අනුපාතිකය

සේවා නියුක්ති අනුපාතිකය යනු , සේවා නියුක්ති ජනසංඛ්‍යාව ශ්‍රමබලකාය ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කළ විට ලැබෙන අගය වේ.

**සේවා නියුක්ති අනුපාතය = සේවා නියුක්ති ජනසංඛ්‍යාව/ශ්‍රම බලකාය × 100**

## ❖ ශ්‍රම බලකාය

ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය ලෙස  නිර්වචනය කරනුයේ සමීක්ෂණ දිනට පෙර සතිය තුළ වැටුපක් හෝ ආර්ථික ප්‍රතිලාභයක් බලාපොරොත්තුවෙන් රැකියාවක් කරන සහ රැකියාවක් කිරීමට කැමැත්තෙන් සිටින වයස අවුරුදු 15 ට හා ඊට වැඩි සියලු පුද්ගලයන් ය.නැතහොත්

වයස අවුරුදු 15 ට හා ඊට වැඩි ආර්ථික වශයෙන් සක්‍රීය සමස්ත ජනගහනයයි.

**ශ්‍රම බලකාය = සේවා නියුක්තිය ජනගහන + සේවා වියුක්ත ජනගහනය**

**ජාතික නිෂ්පාදිතය, වියදම, ආදායම සහ සේවා නියුක්තිය** — **34 වැනි සංඛ්‍යා සටහන**

**ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (අ)**

ප්‍රතිශතය

| කාණ්ඩය | 2010 | 2010 | 2011 | 2011 | 2012 | 2012 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 (ඉ)(ට) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|

35 වැනි සංඛ්‍යා සටහන

## රැකියාවේ සේවා තත්ත්වය අනුව සේවා නියුක්තිය (අ)

ප්‍රතිශතය

| කාලපරිච්ඡේදය | රාජ්‍ය අංශයේ සේවකයන් | පෞද්ගලික අංශයේ සේවකයන් | සේව්‍යයන් | ස්වයං රැකියාවල නියුතු වූවන් | ගෙවීමක් නොලද පවුලේ සාමාජිකයන් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2010 (ආ)(ඇ) | 13.9 | 41.3 | 2.7 | 31.5 | 10.7 | 100.0 |
| 2010 (ආ)(ඇ) | 14.3 | 41.2 | 2.6 | 31.5 | 10.4 | 100.0 |
| 2011 (ආ)(ඇ) | 14.3 | 40.4 | 2.9 | 31.4 | 11.0 | 100.0 |
| 2011 (ඉ)(ඊ) | 14.6 | 40.5 | 2.9 | 31.5 | 10.6 | 100.0 |
| 2012 (ආ)(ඇ) | 15.0 | 41.4 | 2.8 | 31.8 | 9.0 | 100.0 |
| 2012 (ආ)(ඉ) | 15.1 | 41.3 | 2.8 | 31.9 | 8.9 | 100.0 |
| 2012 (ඉ)(ඊ) | 15.3 | 41.2 | 2.8 | 31.9 | 8.7 | 100.0 |
| 2013 (ඉ)(ඊ) | 15.2 | 40.5 | 3.0 | 32.2 | 9.1 | 100.0 |
| 2014 (ඉ)(ඊ) | 15.5 | 40.9 | 2.7 | 32.0 | 8.9 | 100.0 |
| 2015 (ඉ)(ඊ) | 15.1 | 41.0 | 3.1 | 32.3 | 8.4 | 100.0 |
| 2016 (ඉ)(ඊ) | 14.6 | 43.3 | 2.7 | 31.6 | 7.8 | 100.0 |
| 2017 (ඉ)(ඊ) | 14.4 | 43.3 | 3.0 | 31.3 | 8.0 | 100.0 |
| 2018 (ඉ)(ඊ) | 14.5 | 43.4 | 2.8 | 32.3 | 7.2 | 100.0 |
| **2019 (ඉ)(ඊ)** | **14.9** | **43.0** | **2.6** | **32.5** | **7.0** | **100.0** |
| පළමු කාර්තුව | 15.0 | 42.9 | 2.7 | 32.5 | 6.9 | 100.0 |
| දෙවන කාර්තුව | 15.0 | 43.5 | 2.5 | 32.4 | 6.6 | 100.0 |
| තෙවන කාර්තුව | 14.8 | 43.2 | 2.6 | 31.9 | 7.4 | 100.0 |
| සිව්වන කාර්තුව | 14.7 | 42.5 | 2.5 | 33.1 | 7.2 | 100.0 |
| **2020 (ඉ)(ඊ)(උ)(ඌ)** | **14.8** | **42.7** | **2.5** | **33.2** | **6.8** | **100.0** |
| පළමු කාර්තුව | 14.9 | 42.7 | 2.5 | 33.2 | 6.6 | 100.0 |
| දෙවන කාර්තුව | 14.8 | 43.2 | 2.3 | 32.8 | 7.0 | 100.0 |
| තෙවන කාර්තුව | 14.5 | 43.5 | 3.0 | 32.7 | 6.3 | 100.0 |
| සිව්වන කාර්තුව | 15.0 | 41.3 | 2.3 | 34.2 | 7.2 | 100.0 |

## ජාතික නිෂ්පාදිතය, වියදම, ආදායම සහ සේවා නියුක්තිය

36 වැනි සංඛ්‍යා සටහන

### ආර්ථික ක්‍රියාකාරිත්වය අනුව සේවා නියුක්තිය (අ)(ආ)

පුද්ගලයන් '000

| අංශය | 2017 | 2018 | 2019 | 2020 (ඈ) | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික (ඈ) |

**ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය පහළ අගයක් ගැනීමට හේතු ,**

- රැකියා සඳහා අවශ්‍ය නිපුණතා සම්බන්ධ ගැටලු
- ශ්‍රම වෙළෙඳපොළ තුළ කාන්තාවන් සඳහා රැකියා අවස්ථා අවම වීම
- ස්ත්‍රී පුරුෂ විෂමතා
- යල්පැන ගිය සමාජ සම්මත
- ශ්‍රී ලාංකික කාන්තාවන් ගෙන් අපේක්ෂා කරන සමාජ භූමිකාව, වගකීම් ඉටු කිරීමට රැඳී සිටීම .
- රාජකාරි ස්ථානයට යෑමට ඒවට ප්‍රවාහන පහසුකම් නොමැති වීම.
- රාජකාරි කාල සීමාවකට අනුගත වීමට අපහසු වීම.

**කාන්තාවන් ආර්ථික වශයෙන් වඩා සක්‍රිය වීමට හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට නම්,**

- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ඇති කිරීම
- නම්‍යශීලී සේවාමුර
- ගුණාත්මක ළමා හා වැඩිහිටි සුරැකුම් පහසුකම්
- ලිංගික හිංසනය පිටු දැකීම

- ආරක්ෂාකාරී ප්‍රවාහනය වැනි ආධාරක පහසුකම් ලබාදීමට අවශ්‍ය ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම අත්‍යාවශ්‍ය වේ.

## ❖ විදේශ සේවා නියුක්තිය

### ශ්‍රී ලංකාව තුළ විදේශ රැකියා සඳහා සංක්‍රමණය වැදගත් වීමට හේතු

- සේවා වියුක්තිය අඩු වීමට හේතු වීම
- ගෙවුම් ශේෂය මත යහපත් බලපෑමක් ඇතිවීම
- ආදායම් ව්‍යාප්තියේ සාධාරණත්වයට හිතකර වීම
- ජාතික ඉතිරි ඉහළ යාම
- දරිද්‍රතාවය අඩු වීම
- විදේශ වත්කම් ඉහළ යාම නිසා මුදල් සැපයුම ප්‍රසාරණය වීම
- කුඩා ව්‍යාපාර සංවර්ධනය වීම
- ජනගහනය වර්ධන වේගය අඩු වීම
- විනිමය අනුපාතිකය ස්ථාවරත්වය රැක ගැනීම

### විදේශ රැකියා සඳහා සංග්‍රමයේ අවාසිදායක බලපෑම

- සමාජ පිරිවැයක් පැවතීම
- තාවකාලිකව හෝ බුද්ධි ගණනයක් සහ පුහුණු ශ්‍රමය ගලා යාම තුළින් ආර්ථික වර්ධනයට අහිතකර ලෙස බලපෑම
- උද්ධමනකාරී බලපෑම් ඇතිවිය හැකි වීම
- පුහුණු ශ්‍රමිකයන් හිඟ වීම නිසා ආර්ථිකයට වන අවාසි

### විදේශ සේවා නියුක්තියේ ඵලදායිතාවය වෙනුවෙන් රජය ගෙන ඇති ක්‍රියාමාර්ග

- විදේශ රැකියා සඳහා නීති විරෝධී ලෙස පුද්ගලයන් බඳවා ගැනීම සම්බන්ධ වැටලීම් සිදු කිරීම
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ශ්‍රම සංක්‍රමණික සේවකයන් සහ ඔවුන්ගේ පවුල් සවිබල ගැන්වීම සඳහා වන ක්‍රියාමාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම
- සංක්‍රමණික සේවකයන්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම

- නීති උල්ලංඝණය කළ නීති විරෝධී ආයතන සහ බලපත්‍රලාභී ආයතන වලි ආයතනවලට එරෙහිව නඩු පැවරීම
- සංක්‍රමණික සේවකයන්ට පහසුකම් සැපයීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මෙහෙයුම් කටයුතු දීප ව්‍යාප්ත වැඩි දියුණු කිරීමේ අරමුණින් සෑම පළාතකම සංක්‍රමණික සම්පත් මධ්‍යස්ථාන පිහිටුවීම

## ❖ සේවා වියුක්තිය

සේවා වියුක්තිය යනු කිසියම් ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් ආර්ථික කටයුත්තක් සඳහා ශ්‍රමය සැපයීමට කැමති එහෙත් ඒ සඳහා අවස්ථාවක් නොලැබ ඇති ජන කොට්ඨාස යයි. මෙය විවෘත සේවාවියුක්තිය විරැකියාව ලෙස හඳුන්වයි.

### සේවා වියුක්ති අනුපාතිකය

**සේවා වියුක්ති අනුපාතිකය = සේවා වියුක්ති පිරිස / ශ්‍රම බලකාය × 100**



## සේවා වියුක්තියේ ප්‍රධාන ප්‍රභේද හතරකි.

### 1. වාරික (සෘතුමය) සේවා වියුක්තිය

ආර්ථික කටයුතු කෙරෙහි වාරිකත්වය බලපාන විට දී හටගන්නා සේවා වියුක්තියයි. එහිදී ආර්ථික ක්‍රියාකාරකම් බහුල කාල වලදී සේවා වියුක්තියේ අඩුවීමක් ද ආර්ථික ක්‍රියාකාරකම් සංකෝචනය වන විට සේවා වියුක්තියේ වැඩිවීමක් දක්නට ලැබේ. කෘෂිකාර්මික, කැණීම්, සංචාරක ව්‍යාපාර, උත්සව කාල වැනි අවස්ථා වාරික සේවා වියුක්තිය නිදසුන් ලෙස දැක්විය හැකිය.

උදාහරණ -: වාරකන් කාලවල දී කාලවලදී ධීවරයන් අතර ඇතිවන සේවා වියුක්තිය

### 2. ඝාර්ෂික සේවා වියුක්තිය

පුද්ගලයින් රැකියා අතර මාරු වෙමින් සිටින කාලයේදී හටගන්නා විරැකියා තත්වයයි. රැකියාවක් කරමින් සිටි පුද්ගලයකු වෙනත් ආකර්ෂණීය රැකියාවකට මාරු වීම පිණිස ස්වකැමැත්තෙන්ම යම් කාලයක් සේවා වියුක්ත සිටීමයි. මෙය 'රැකියා සෙවීමේ විරැකියා තත්ත්වය' ලෙස ද හැඳින්වේ.

### 3. ව්‍යුහමය සේවා වියුක්තිය

තාක්ෂණය හටගන්නා ප්‍රබල වෙනස්කම් නිසා හෝ කිසියම් භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුම සදාකාලිකවම ඉවත්ව යාම නිසා ශ්‍රම වෙළඳපොලේ ඇති විය හැකි විරැකියා තත්වයයි.

උදාහරණ : යන්ත්‍ර සූත්‍ර වලින් රෙදිපිළි නිෂ්පාදනයට යොමු වීමෙන් අත් යන්ත්‍ර සඳහා පැවැති ඉල්ලුම අඩු වී එම අංශයේ අයට රැකියා අහිමිවීම , පරිගණක තාක්ෂණය දියුණු වීම නිසා යතුරු ලියන්නන්ට රැකියා අහිමි වීම

### 4. චක්‍රීය සේවා වියුක්තිය

ව්‍යාපාර චක්‍රයේ දෝලනයක් සමග හටගන්නා සේවා වියුක්ති තත්වයකි.

උදාහරණ : මෑත කාලයේ ග්‍රීසිය ස්පාඤ්ඤය වැනි යුරෝපයේ රටවල හටගෙන ඇති ආර්ථික පසුබෑම ප්‍රතිඵලයක් ලෙස එම රටවල හටගත් විරැකියාව

## ❖ ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති තත්වයෙහි විශේෂ ලක්ෂණ සහ ප්‍රවණතා

- ශ්‍රී ලංකාවේ කාන්තා සේවා වියුක්තිය ඉහළ මට්ටමක පැවතීම

## ස්ත්‍රී සේවා වියුක්තිය ඉහළ මට්ටමක පැවතීමට හේතු,

1. ගෘහස්ථ වගකීම වල නිරත වීම
2. කාන්තාවන්ට සුදුසු රැකියා ප්‍රමාණවත්ව බිහි නොවීම
3. ශ්‍රම වෙළෙඳපොළඳපොළ හි පවත්නා දෘඩ තාවයන්
4. රාජකාරි කාලසීමාවන් ට අනුගත වීමට අපහසු වීම
5. උගත් කාන්තාවන් නොවිධිමත් අංශයේ රැකියාවක නියුක්ත වීමට අකමැති වීම
6. පොදු ප්‍රවාහන සේවා සම්බන්ධ දුෂ්කරතාවයන්ට මුහුණ පෑම

## ස්ත්‍රී සේවා වියුක්තිය පහළ දැමීමට ගත හැකි පියවර

1. නම්‍යශීලී සේවා කාලය හඳුන්වා දීම
2. අර්ධකාලීන රැකියා සඳහා ඉඩකඩ සැලසෙන පරිදි කම්කරු නීති ලිහිල් කිරීම
3. නිවසේ සිට රැකියා කිරීමේ විකල්ප හා ස්වයං රැකියා ප්‍රචලිත කිරීම
4. දරුවන් රැක බලා ගැනීමේ පහසුකම් ක්‍රමවත් කිරීම
5. කර්මාන්ත ප්‍රධාන නගර ආශ්‍රිතව සංකේන්ද්‍රණය වීම වෙනුවට ප්‍රාදේශීය ව්‍යාප්ත කිරීමට කටයුතු කිරීම
6. පොදු ප්‍රවාහන සේවය කාර්යක්ෂම කිරීම

- ශ්‍රී ලංකාවේ තරුණ සේවා වියුක්තිය ඉහළ මට්ටමක පැවතීම
- ශ්‍රී ලංකාවේ උගත් සේවා වියුක්තිය ඉහළ මට්ටමක පැවතීම

ශ්‍රී ලංකාවේ සමස්ත සේවා වියුක්ථ සේවා වියුක්තිය අවම මට්ටමක පැවතුණ ද තවමත් ප්‍රාදේශීය හා පළාත් මට්ටමින් ඇතැම් ප්‍රදේශවල ඉහළ සේවා වියුක්තියක් දක්නට ලැබේ ඊට හේතු වන්නේ,

- **නිපුණතා නොගැලපීමේ උපන්‍යාසය**

  රැකියා සඳහා සදහා ඉල්ලුම් කරන්න කරන්නන් ගේ සුදුසුකම් හා හැකියාවන්, ශ්‍රම වෙළදපොළ අවල අවශ්‍යතාවයන් සමග නොගැලපීම

- **පෝලිමේ බලා සිටීමේ උපන්‍යාසය**

ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් පුද්ගලික අංශයේ රැකියාවලට වඩා රාජ්‍ය අංශයේ රැකියා වලට වැඩි කැමැත්තක් දක්වන බැවින් රජයේ රැකියාවක් අපේක්ෂාවෙන් බලා සිටීම

- **මන්දගාමී ආර්ථික වෘද්ධිය**

ශ්‍රම බලකායේ වර්ධනයට සාපේක්ෂව ආර්ථික වර්ධනය වේගවත් නොවීම කරණ කොටගෙන විරැකියා තත්ත්වය උග්‍ර වන බව මින් පැහැදිළි කෙරේ

- **ශ්‍රම වෙළෙඳපොළ**

සීමාකාරී කම්කරු නීතිරීති නිසා පෞද්ගලික අංශ විසින් රැකීරක්ෂා ජනනය කිරීම සීමා කිරීමයි

## ❖ ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය අවම කිරීමට ඉදිරිපත් කරන යෝජනා

- ආර්ථික වෘද්ධි වේගය ඉහළ නැංවීම
- කාර්මික පදනම පුළුල් කිරීම
- සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශ ප්‍රවර්ධනය තුළින් ස්වයං රැකියා අවස්ථා ඉහළ නැංවීම
- අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් නිපුණතා නොගැලපීම් අවම කිරීම
- දේශීය හා විදේශ ආයෝජන අවස්ථා පුළුල් කිරීම
- විදේශ රැකියා අවස්ථා ඉහළ නැංවීම
- කම්කරු නීතිරීති නීති රීතීන් නම්‍ය ශීලී කිරීම
- යටිතල පහසුකම් වර්ධනය
- වෘත්තීය පුහුණුව

# ❖ යටිතල පහසුකම් සංවර්ධනය

නිෂ්පාදනය හා හුවමාරුව කාර්යක්ෂමව සිදු වීම සඳහා මූලික යටිතල පහසුකම් කිහිපයක් සපුරා ගත යුතුය. ඒවා අතර වාරිමාර්ග, වරාය, ගුවන්තොටුපළ, සන්නිවේදනය, විදුලිය හා ජලය ප්‍රධාන තැනක් ගනී. මෙම සේවාවන් අඛණ්ඩව සැපයීම නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව අවශ්‍ය වේ. එහෙත් බොහෝ සංවර්ධනය වන රටවල යටිතල පහසුකම් ප්‍රබල දුර්වලතා දක්නට ලැබේ. මෙය එම රටවල ආර්ථික වෘද්ධි ක්‍රියාවලියට බලපාන සංරෝදකයක් වේ.

## ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් ඉලක්ක කරගත් සේවා

### ❖ ප්‍රවාහන සේවා

- කොළඹ මාතර අධිවේගී මාර්ගය

### ❖ විදුලි සංදේශ සේවා

- ශ්‍රී ලංකා විදුලි සංදේශන හා නියාමන කොමිෂන් සභාව

### ❖ ජල විදුලි උත්පාදනය

- කොත්මලේ ජල විදුලි බලාගාරය

### ❖ බලශක්ති උත්පාදනය

- නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය

රජය විසින් විදේශ ආධාර හා ආයෝජන ලබා ගනිමින් සහ පුද්ගලික අංශයද සම්බන්ධ කරගනිමින් මෙම සේවාවන්හි දියුණුවට කටයුතු කරයි.

## ❖ ආර්ථික හා සමාජ යටිතල පහසුකම්

### ➢ ආර්ථික යටිතල පහසුකම්

| දෘඩ යටිතල පහසුකම් | දෘඩ යටිතල පහසුකම් |
|---|---|
| මහාමාර්ග | මූල්‍ය ආයතන පද්ධතිය |
| වරාය | ශ්‍රම බලකා නිපුණතා සංවර්ධනය |
| වාරිමාර්ග | වෘත්තීමය පුහුණු වීම් |
| ඇලවේලි | තාක්ෂණය හුවමාරු කිරීමට අදාළ වැඩසටහන් |

### ➢ සමාජ යටිතල පහසුකම්

| දෘඪ යටිතල පහසුකම් | දෘඪ යටිතල පහසුකම් |
|---|---|
| පාසල් | සමාජ සංරක්ෂණ ක්‍රම |
| රෝහල් | ප්‍රජා සේවාවන් |
| නිවාස යෝජනා ක්‍රම | පරිසර සංරක්ෂණ වැඩසටහන් |

## ❖ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රාජ්‍ය හා පෞද්ගලික සහයෝගීතාවය

මින් අදහස් වන්නේ දේශීය හෝ විදේශීය ආයෝජකයන් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රජය සමඟ හවුල්කාරීත්වය ක්‍රමයකට එළඹීමයි.

මේ සඳහා රජයේ විවිධ ක්‍රම යටතේ පුද්ගලික අංශ සම්බන්ධ කර ගනී. ඒවා නම්,

- ඉදිකිරීම, මෙහෙයවීම හා පැවරීම (BOT ක්‍රමය)
- ඉදිකිරීම, හිමිකර ගැනීම හා මෙහෙයවීම (BOO ක්‍රමය)
- ඉදිකිරීම, හිමිකර ගැනීම හා මෙහෙයවීම හා පැවරීම (BOOT ක්‍රමය)

## රජයේ කාර්යභාරය

මෙහිදී අවශ්‍ය ඉඩම්, බලපත්‍ර ලබාදීම, ආරක්ෂණ ක්‍රියාමාර්ග හා ස්වෛරීත්ව ඇපකාරීත්වය ලබාදීම, අවශ්‍ය අරමුදල් ලබාගැනීමේ ක්‍රියාවලීන්ට පහසුකම් සැලසීම හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හිතකර වාතාවරණයක් සකස්කර දීම යනාදිය තුළින් රජය දායක වේ.

## පෞද්ගලික අංශයේ කාර්යභාරය

අවශ්‍ය අරමුදල් වලින් කොටසක් ලබා දීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා මෙහෙයුම් කටයුතු සිදු කිරීම යනාදිය තුලින් පෞද්ගලික අංශය දායක වේ.

### යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රාජ්‍ය පෞද්ගලික සහයෝගිත්වයේ වැදගත්කම

- රාජ්‍ය අයවැය මත වන පීඩනය අවම වීම
- විදේශ ණය ගැති භාවය අඩුවීම
- විදේශීය ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම තුලින් ගෙවුම් ශේෂයට හිතකර වීම

- විවිධ අවදානම් පෞද්ගලික අංශය සමඟ එක්ව මුහුණ දීමට හැකි වීම
- පෞද්ගලික අංශයේ දේශීය හා විදේශීය විශේෂඥ දැනුම ලබා ගත හැකි බැවින් කාර්යක්ෂමතාවය, ඵලදායකත්වය හා ගුණාත්මකභාවය ඉහළ නැංවිය හැකි වීම
- ව්‍යාපෘති තුළින් අනාගත ලාභාංශ හා ප්‍රාග්ධන ලාභ හරහා රාජ්‍ය ආදායම් ඉහළ යාම
- තාක්ෂණික සංවර්ධන සංවර්ධන ප්‍රවර්ධනය සිදුවීම

**මෙම ක්‍රමය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති කිහිපයකට උදාහරණ,**

- කොළඹ කටුනායක අධිවේගී මාර්ගය
- දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය
- දකුණු කොළඹ වරාය ව්‍යාපෘතිය
- ඔලුවිල් සංවර්ධන ව්‍යාපෘතිය
- හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය
- මත්තල දෙවන ජාත්‍යන්තර ගුවන්තොටුපළ

# සංචාරක කර්මාන්තය

## සංචාරකයන් පැමිණීම් වර්ධනයට බලපෑ හේතුන්

- ජාත්‍යන්තර සංචාරක සංවිධාන මගින් ලබාදුන් නිර්දේශ හා සම්මාන
- ප්‍රබල ප්‍රවර්ධන වැඩසටහන්
- සංචාරක කර්මාන්තයේ ආයෝජන කැපී පෙනෙන ලෙස ඉහළ යාම
- සේවා සැපයුමෙහි ධනාත්මක බව ඉහළ යාම
- ගුවන් හා මුහුදු මාර්ග හරහා අනෙකුත් රටවල් සමඟ සම්බන්ධතාව වැඩි දියුණු වීම

**ශ්‍රී ලංකාව හා සංචාරයේ යෙදෙන විශාල සංචාරක ප්‍රභවයන්,**

- ඉන්දියාව
- චීනය
- එක්සත් රාජධානිය
- ජර්මනිය
- ඕස්ට්‍රේලියාව

### ශ්‍රී ලංකාවට සංචාරකයන් පැමිණීමේ අරමුණු,

- ව්‍යාපාර කටයුතු සඳහා
- විවේකය ගත කිරීමට
- ආගමික හා සංස්කෘතික කටයුතු සඳහා
- නෑදෑ  මිත්‍රාදීන් මුණගැසීමට
- සෞඛ්‍ය, අධ්‍යාපන කටයුතු සඳහා

### ශ්‍රී ලංකාව තුළ සංචාරක ප්‍රවර්ධනය සඳහා ගත් ක්‍රියාමාර්ග හා වැඩසටහන්

- ප්‍රචාරණ වැඩසටහන්
- ඍසහ) වැනි පිළිගත් ජාත්‍යන්තර මාධ්‍ය ආයතන තුල සිදුකර ප්‍රචාරණ වැඩසටහන්
- අන්තර්ජාලය පදනම් කරගත් ප්‍රවර්ධන කටයුතු
- සංචාරකයන් සඳහා සුහදශීලී ත්‍රී රෝද රථ හඳුන්වා දීම
- නව ජීවිතාරක්ෂක ඒකක පිහිටුවීම
- සංචාරක සල්පිල් පැවැත්වීම
- ජංගම සංචාරක පොලිස් කොට්ඨාස පිහිටුවීම

### සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාව තුළ ප්‍රවර්ධනය සඳහා සඳහා ගත හැකි ක්‍රියාමාර්ග

- යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම
- රජය හා සංචාරක ව්‍යාපාරය පාර්ශවකරුවන් අතර මනා සම්බන්ධීකරණයක් ගොඩනැගීම
- උසස් කාර්යක්ශම පොදු ප්‍රවාහන පහසුකම් මුළු රටම ආවරණය වන පරිදි සැකසීම

## ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ වර්තමාන තත්ත්වය 2020

- COVID 19 වසංගතය සංචාරක කර්මාන්තයට අභියෝගයක් වී ඇත.
- 2019 දී පාස්කු ඉරිදා ප්‍රහාරයන් නොතකා සංචාරක ව්‍යාපාරය 2020 දෙසැම්බර් - මාර්තු මාසවල ප්‍රබල ලෙස ඉදිරියට පැමිණියේය.
- 2018 ජනවාරි සිට මාර්තු දක්වා සංචාරකයින්ගේ පැමිණීම 507,311 ක් වූ අතර එය 2018 දී මිලියන 2.3 ක් හා 2019 දී මිලියන 1.9 ක් විය.
- ජාත්‍යන්තර අමුත්තන් සඳහා මගී ගුවන් ගමන් සහ නැව් පැමිණීම 2020 මාර්තු මාසයේ සිට නතර කරන ලදී.

### COVID 19 බලපෑම නිසා සංචාරක කර්මාන්තය සඳහා ප්‍රතිසාධන උපක්‍රම

- දැනටමත් ආරම්භ කර ඇති සහන වැඩසටහන් හරහා සංචාරක ව්‍යාපාර සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා අඛණ්ඩව සහයෝගය ලබා දීම.
- ගුවන් තොටුපල විවෘත කිරීමේ උපායමාර්ගය සවිස්තරාත්මක මූල පත්‍රයක් සහිතව සැලසුම් කර ඇත.
- නවාතැන් සහ වෙනත් සේවා සපයන්නන්ට ආරක්ෂිත සහ සුරක්ෂිත සහතික ප්‍රදානය කිරීම
- ආයුර්වේදය සහ හෙළ වෙදකම විසින් සුව කිරීම ප්‍රවර්ධනය කිරීම.
- 2021 සිට Global marketing campaign සඳහා සූදානම් වීම.
- ගෝලීය ප්‍රචාරණ උපාය මාර්ග සංවර්ධනය.

# ප්‍රාදේශීය සංවර්ධන

ප්‍රාදේශීය සංවර්ධනය යනු, අඩු ආර්ථික සංවර්ධනයක් සහිත ප්‍රදේශ සඳහා සහාය ලබා දීමට ගනු ලබන ක්‍රියා මාර්ගයන්ය.

ප්‍රාදේශීය සීමාවන් එම සහය ක්‍රියාමාර්ගයන් ගේ භාවිතයන් හා ඉලක්ක එකිනෙකට වෙනස් වේ. මේ අනුව, ප්‍රාදේශීය සංවර්ධනය යන ඉතා පුළුල් යෙදුමක් බව පෙනෙන්නට ඇතත් සරල අර්ථයෙන් ආර්ථික ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් එය ප්‍රාදේශීයව පවත්නා විෂමතාවයන් අවම කිරීම සඳහා රැකියා හා වත්කම් ජනනය කිරීම සඳහා ගනු ලබන පොදු උත්සාහයක් වශයෙන් හඳුන්වනු ලැබේ.

### ප්‍රාදේශීය කර්මාන්තපුර සංවර්ධන වැඩසටහන

- අගනුවර සහ ඉන් බැහැර ප්‍රදේශ අතර යටිතල පහසුකම් සැපයීමේ විෂමතාමයක් පැවතීම රට තුළ කර්මාන්ත සංවර්ධනය කිරීමට ඇති එක් ප්‍රධාන බාධාවකි.
- අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක කරන එක් ප්‍රධාන ව්‍යාපෘතියක් ලෙස "ප්‍රාදේශීය කර්මාන්තපුර සංවර්ධන" වැඩසටහන දැක්විය හැක.

- මෙම වැඩසටහන යටතේ බස්නාහිර පළාත තුළ ඒකරාශීවී තිබූ කර්මාන්ත දිවයින පුරා කර්මාන්තපුර 26 ක් සංවර්ධනය කිරීම තුළින් ග්‍රාමීය ප්‍රදේශ කරා ව්‍යාප්ත කිරීම සිදුකර ඇත.
- ග්‍රාමීය ප්‍රදේශවල ඇති සුදුසු ඉඩම් හඳුනාගෙන කර්මාන්තකරුවන්ට ඔවුන්ගේ කර්මාන්ත පිහිටුවීමට අවශ්‍ය මාර්ග, විදුලිය, ජලය ආදී මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මෙම වැඩසටහන යටතේ කරනු ලබයි.
- 2012 වසර අවසාන වන විට මෙම වැඩසටහන යටතේ කර්මාන්ත 277 ක් ඔවුන්ගේ කර්මාන්තායතනවල වාණිජ නිෂ්පාදන අරඹා ඇති අතර කර්මාන්ත 48) ක් සිය ඉදිකිරීම් කටයුතුවල නියැලේ.
- මෙම වැඩසටහන මගින් රැකියා අවස්ථා 15,182 ක් බිහිකර ඇත.

### ප්‍රාදේශීය සංවර්ධනයේ වැදගත්කම

- යටිතල පහසුකම් සංවර්ධනය වීම
- සේවා නියුක්තිය ඉහළ යාම
- දේශීය නිශ්පාදිතය ඉහළ යාම.
- මිනිසුන්ගේ ජීවන තත්වය ඉහළ යාම.
- නවෝත්පාදන දිරිමත් වීම.
- ප්‍රාදේශීය සංවර්ධන විශමතා අවම වීම.
- කුඩා කර්මාන්ත දිරිමත් වීම.
- ව්‍යවසායකයන් දිරිමත් වීම.

### ආර්ථිකයේ ප්‍රාදේශීය සංවර්ධන විෂමතා ඇති වීම කෙරෙහි බලපාන සාදක

- රාජ්‍ය නිලධාරිවාදය.
- දේශපාලන පක්ශපාතීත්වය.
- දේශපාලන අස්ථාවරත්වය.
- දියුණු තාක්ෂණික ක්‍රම බාවිතා නොකිරීම.
- වෘත්තීමය දැනුම හා පුහුණුව ලබා ගැනීමට ඇති අවස්ථා දුලබ වීම.

## සමකාලීන ආර්ථික සිදුවීම් සහ ප්‍රතිපත්ති

### ➢ මෑත කාලීන වශයෙන් සිදු වූ දේශීය හා ගෝලීය ආර්ථික සිදුවීම්.

## ශ්‍රී ලංකා ආර්ථිකයට බලපෑ දේශීය සිදුවීම්.

2019) වසරේ පළමු භාගයේ දී පාස්කු ඉරුදින ප්‍රහාරය වල බලපෑම ද ඇතුළුව මූලික වශයෙන් දේශීයව පැන නැගුණු අභියෝග මධ්‍යයේ ශ්‍රී ලංකා ආර්ථිකය මන්දගාමී වර්ධනයක් වාර්තා කළේය.

එසේම 2020 වර්ෂයේ දී ලොව පුරා ව්‍යාප්ත වූ කොරෝනා වසංගතය ද ශ්‍රී ලංකා ආර්ථිකයට විශාල වශයෙන් බලපෑම් ඇති කළේය.

| | |
|---|---|
| **2018** | 3.9 |
| **2019** | 2.3 |
| **2020** | -3.6 |

විරැකියා තත්ත්වය ඉහළ යාම, මීට එක් හේතුවක් වශයෙන් මන්දගාමී ආර්ථික වර්ධනය ද බලපෑම් ඇති කරන ලදී.

ශ්‍රී ලංකා ආර්ථිකය 2020 වසරේ දී covid 19 වසංගතය හේතුවෙන් දේශීය හා ගෝලීය වශයෙන් මතුවූ අභියෝග මධ්‍යයේ 2019 වසරේදී වාර්තා කළ 2.3% ක වර්ධනයට සාපේක්ෂව 1.7% කින් පමණ පහළ ගොස් ඇත. දැනට ප්‍රකාශිත නිල සංඛ්‍යා ලේඛනවලට අනුව ශ්‍රී ලංකා ආර්ථිකය 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ 3.7% වර්ධනයට සාපේක්ෂව 2020 පලමු කාර්තුවේ දී 1.6% කින් පහළ යන ලදී.

## විරැකියා අනුපාතය ඉහළ යාමට බලපාන සාධක

- covid 19 වසංගතය මධ්‍යයේ ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම පිළිබිඹු කරමින් 2019 වසරේ දී 4.8% ක් වූ විරැකියාව 2020 වසරේදී 5.5% ක් දක්වා ඉහළ ගියේය.
- ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය 2019 වසරේ දී පැවැති 52.3% සිට 2020 වසරේදී 50.6% දක්වා අඩු විය.

- පුරුෂ ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය: 73.0% ⟶ 71.9%
- ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය: 34.5% ⟶ 32.1%

සේවා නියුක්ති ජනගහනයේ 2019 වසරේ දී වාර්තා වූ මිලියන 8.181 සිට 2020 වසරේදී මිලියන හතයි 7.999 දක්වා අඩුවිය. රැකියා පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ කර්මාන්ත හා සේවා කටයුතුවල රැකියා නියුක්තිය අඩු වීමයි.

| සේවා නියුක්තියේ දායකත්වය | 2019 | 2020 |
|---|---|---|
| • කෘෂිකර්මාන්තය | 25.3% | 27.1% |
| • කර්මාන්; | 27.6% | 26.9% |
| • සේවා | 47.1% | 46.0% |

## ➢ ස්ත්‍රී සේවා වියුක්තිය ඉහළ යාමට හේතු

- වෘත්තීය ආරක්ෂාවට පිලිබඳ ගැටළු පැවතීම
- වෘත්තිය පුහුණුව නොමැතිවීම
- කාන්තාවන් වෙහෙස අඩු රැකියා අපේක්ෂා කිරීම
- වැටුප් හා උසස්වීම් සම්බන්ධව ස්ත්‍රී පුරුෂ විෂමතාවයන් පැවතීම
- පොදු ප්‍රවාහනයේදී සිදුවන හිංසන
- යල් පැන ගිය සමාජ සම්මත.
  උදාහරණ: කාන්තාව නිවසට වී තම දරුවන් රැක බලා ගැනීම

## ➢ උගත් සේවා වියුක්තියට බලපාන සාධක

- රජයේ රැකියා අපේක්ෂා කිරීම
- පහසු රැකියා අපේක්ෂා කිරීම
- ඉහළ වැටුප් අපේක්ෂා කිරීම්
- වෘත්තීය හැර යන ඇතැයි දරන මතය නිසා රැකියා අවස්ථා නොලැබී යාම
- ශ්‍රම වෙළෙඳපොළ තුළ පවතින දැඩි තරග තරගශකාරීත්වය
- උසස් අධ්‍යාපන අවස්ථා බහුල වීම උදාහරණ: රාජ්‍ය හා පෞද්ගලික විශ්ව විද්විද්‍යාල

## ➢ තරුණ විරැකියා අනුපාතය ඉහළ යාමට හේතු

- භාෂා හැකියාව ප්‍රමාණවත් නොවීම

- වෘත්තීය පුහුණුවක් නොමැති වීම
- පහසු රැකියා අපේක්ෂා කිරීම
- අධ්‍යාපනික අවශ්‍යතා බහුල වීම
- තරුණ පරපුර ශ්‍රමය යොදවන රැකියා වෙනුවට බුද්ධිය යොදවන රැකියා වලට වැඩි කැමැත්තක් දැක්වීම

### ➢ ශ්‍රී ලංකා ආර්ථිකයට බලපෑ ගෝලීය සිදුවීම්

- ආසියාවතික මූල්‍ය අර්බුදය
- යුරෝපා ආර්ථික අර්බුදය
- ගෝලීය ආර්ථිකයේ රටවල් අතර දිගින් දිගටම ඇති වූ අර්බුදයක්
- ලෝක ආහාර අර්බුදය
- ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම
- විවිධ කලාපවල ඇති වූ ස්වාභාවික උපද්‍රව

## ➢ දේශීය හා ගෝලීය සිදුවීම් මගින් ශ්‍රී ලංකා ආර්ථිකයට කරන ලද බලපෑම.

2019 වසර අවසන් වන විට ශ්‍රී ලංකාව මුහුණ දුන් ප්‍රධානතම අභියෝගය වූයේ වසර කිහිපයක්ම අඩු වර්ධන වේගයක් පෙන්නුම් කළ ආර්ථිකය පුනර්ජීවනය කිරීම්යි.

එසේ වෙතත් covid-19 වසංගතය පැතිරීම හා වසංගතය පැතිරීම වැළැක්වීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග හමුවේ ආර්ථිකයේ සියලුම පාර්ශ්කරුවන් මෙන්ම ආර්ථිකය යළි යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලිය ද දැඩි දුෂ්කරතාවලට මුහුණ දුන්නේ ය.

**පාස්කු ඉරුදින ප්‍රහාරය නිසා සේවා අංශයට සිදු වූ සිදු වූ බලපෑම**

| ස්ථාවර මිල යටතේ වර්ධනය | 2019 පළමු කාර්තුව % | 2019 දෙවන කාර්තුව % |
|---|---|---|
| තොග සහ සිල්ලර වෙළඳාම | 4.4 | 1.3 |
| ප්‍රවාහන | 1.8 | (1.5) |
| නවාතැන් සහ ආහාර පාන | 4.5 | (9.9) |

පාස්කු ඉරුදින ප්‍රහාර වලින් පසුව ආරක්ෂිත හේතු මත පුද්ගල ගමනාගමනය අඩු වීම සහ ආර්ථික කටයුතුවල පහත වැටීම හමුවේ 2019 වසරේ දී මහාමාර්ග, දුම්රිය මාර්ග සහ ගුවන් මගින් සිදුකරන ලද මගී සහ භාණ්ඩ ප්‍රවාහනය යන දෙඅංශයේම පසුබෑමක් ඇති විය.

## ❖ covid 19 වසංගතයේ බලපෑම්

covid 19 වසංගතයේ බලපෑම පිළිබිඹු කරමින් 2020 වසරේදී ශ්‍රී ලංකා ආර්ථිකය පසුබෑමකට ලක්විය විය.

| **ආර්ථික කටයුතු** | **වාර්ෂික වර්ධන අනුපාතිකය %** | |
|---|---|---|
| | **2019** | **2020** |
| කෘෂිකර්මාන්තය වන වගාව සහ ධීවර | 1.0 | -2.4 |
| කර්මාන්ත | 2.6 | -6.9 |
| සේවා | 2.2 | -1.5 |
| භාණ්ඩ මත බදු අඩු කිරීමේ සහනාධාර | 2.4 | -8.0 |
| **දළ දේශීය නිෂ්පාදිතය** | **2.3** | **-3.6** |

- වසරේ දෙවන කාර්තුවේ දී ආර්ථිකය වාර්ෂික ලක්ෂමය පදනම මත 16.4% සංකෝචනය වීම, 2020 වසරේදී ආර්ථිකයේ සමස්ථ සංකෝචනයක් වාර්තා වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.
- 2020 පවත්නා වෙළෙඳපොළ මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයෙහි වියදම් ප්‍රවේශයට අනුව 2019 වසරේ දී 5.5% ක සංකෝචනයක් වාර්තා කළ දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය, 2020 වසරේදී 6.2% කින් තවදුරටත් පහළ ගියේය.
- දළ දේශීය දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස දේශීය ඉතිරි කිරීම් 2019 වසරේදී පැවති 20.7% ක සිට 2020 වසරේදී 18.9% ක් දක්වා අඩු විය.

# ➢ දේශීය හා ගෝලීය ආර්ථික සිදුවීම් කෙරෙහි බලපාන් සාදක

## ❖ මතුපිට උද්ධමනය උච්චාවචනයන් සඳහා බලපාන සාධක.

- මිල සූත්‍ර පාදක කරගත් දේශීය ඉන්ධන මිල ගණන් ඇතුළු පාලිත මිල ගණන් ඉහළ දැමීම
- නිවාස සඳහා කුලී ඉහළ යාම
- තීරුබදු සංශෝධන
- 2018 වසරේ අග භාගයේ දී රුපියල් තියුණු ලෙස අවප්‍රමාණය වීමෙන් පසු කාලීන බලපෑම
- ආහාර මිල ගණන් අඩු මට්ටමක පැවතීම
- ආහාර මිල ගණන් නැවත ඉහළ යාම

## ❖ ගෝලීය ආර්ථික සිදුවීම් සඳහා බලපාන සාදක

| ගෝලීය ආර්ථික සිදුවීම් | ගෝලීය ආර්ථික සිදුවීම් සඳහා බලපෑ සාධක | ශ්‍රී ලංකා ආර්ථිකයට කරන බලපෑම |
|---|---|---|
| **ආසියාතික මූල්‍ය අර්බුදය** | අග්නිදිග ආසියානු කලාපයේ මූල්‍ය වෙළෙඳපොළ දැඩි පීඩනයකට ලක් වීම. විදේශ ව්‍යවහාර මුදල් ඒකක බොහෝ සේ අවප්‍රමාණය වීම. | ශ්‍රී ලංකා රුපියල් අවප්‍රමාණය වීම. ආසියාතික රටවලින් ආනයනය කරන ලද භාණ්ඩ මිල අධික වීම. |
| **යුරෝපා ආර්ථික අර්බුදය** | 2006 වසරේ සිට අමෙරිකානු හා යුරෝපා කලාප වල ඇති වූ අවපාත තත්වය. | ශ්‍රී ලංකාවේ අපනයන වෙළෙඳපොළ විදේශ සේවා නියුක්තිය හා විදේශ ආයෝජන ඉහල යාම. |
| **ලෝක ආහාර අර්බුදය** | ඉන්ධන නිෂ්පාදනයට ආහාර විශාල වශයෙන් යොදා ගැනීම. | ශ්‍රී ලංකාවට ආනයන කරනු ලැබූ තිරිඟු පිටි, කිරිපිටි මිල ඉහළ යාම. |
| **ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම** | වේගවත් කාර්මික විප්ලවය හේතුවෙන් ගෝලීය අවකාශයට මුදා හැරෙන වායුන් ප්‍රමාණය ඉහළ යාම. | සාගර සම්පත් විනාශ වී යාම, බෝග ඵලදාව අඩුවීම. |

# සමකාලීන ආර්ථික ප්‍රතිපත්ති

2019 අයවැය වාර්තාව 2019 මාර්තු ) වන දින "ජනතාවට ශක්තිය, දුප්පතුන්ට රැකවරණය, Enterprises Sri Lanka" තේමාව යටතේ හිටපු මුදල් අමාත්‍ය මංගල සමරවීර මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

ඒ යටතේ ආදායම් යෝජනා රාශියක් ද ඉදිරිපත් කරන ලදී. තෝරාගත් භාණ්ඩ සඳහා ආර්ථික සේවා ගාස්තුවක් නියම කිරීම්, බීඩි කොළ සඳහා වූ සෙස් බදු සංශෝධනය කිරීම්විදේශ ගමන් පත්‍ර නිකුත් කිරීමේ

ගාස්තු හා ආගමන බදු සංශෝධනය කිරීම, සිගරට් හා අරක්කු හා තෝරාගත් භාණ්ඩ සඳහා නිෂ්පාදන බදු සංශෝධනය කිරීම ආදී ඒවා ඒ අතර විය.

## 2020 දී කෝවිඩ් 19 වසංගතය මධ්‍යයේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා අනුගමනය කළ ප්‍රතිපත්ති

- සමාජ ආරක්ෂණ වැඩ වැඩසටහන් පුළුල් කිරීම.
- ඉලක්කගත පෝෂණය ආධාරක වැඩ වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාම.
- සැපයුම් දාමයේ පාර්ශවකරුවන්ට නොසැලී සිටීම සඳහා හදිසි මූල්‍ය අවශ්‍යතා සපුරාලීම පිණිස පහසුකම් සැපයීම.
- රජය විසින් ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම සහ මහජනයා අතර ඒවා බෙදා හැරීම.
- දේශීය කර්මාන්තය දිරිමත් කිරීම.
- ආහාර සැපයුම් දාමයට සහභාගිවන්නන් විසින් සෞඛ්‍ය හා ආරක්ෂණ රෙගුලාසි දැඩි ලෙස පිළිපැදීම.

  කොළඹ වරාය නගර කොමිසම ස්ථාපිත කිරීම මගින් ලොව පුරා වන ආයෝජන ආකර්ෂණය මධ්‍යස්ථාන හා සමානවම ව්‍යාපාර පවත්වාගෙන යාමේ පරිසරයක් නිර්මාණය කරමින් ඒ හරහා විදේශීය ඍජු ආයෝජන ගලා ඒම් ඉහළ මට්ටමකට ඔසවා තැබෙනු ඇතැයි අපේක්ෂා කිරීම.

- Covid - 19 හේතුවෙන් රැකියා පටිපාටින් නිවසේ සිට රැකියාවේ නිරත වීම දක්වා විතැන් වීම.
- විශේෂයෙන්ම, රැකියා චර්යා පිළිවෙත් සම්බන්ධයෙන් වසංගතය කාල පරිච්ඡේදය තුළ ශ්‍රම වෙළෙඳපොළට ඇති කළ පෙර නොවූ විරූ බලපෑම මධ්‍යයේ ව්‍යාපාර අඛණ්ඩව පවත්වාගෙන යෑමේ තාවකාලික පියවරක් ලෙස නිවසේ සිට රැකියාවේ නිරත වීමේ ක්‍රමය Work From Home වඩාත් ජනප්‍රිය විය.

## ❖ සහස්‍ර අභියෝගතා සමායතනය (MCC - Millennium Challenge Corporation)

උඌණ සංවර්ධන රටවල්දිළිඳුකම පිටු පිටුදැකීම හා ආර්ථික වර්ධනය ඉදිරියේ ඇති සංරෝධක ඉවත් කිරීම උදෙසා ඇමරිකා එක්සත් ජන ජනපදයේ මූලයාධාර පිරිනැමීම වෙනුවෙන් ඇමරිකා එක්සත් ජනපදයෙ 2003 සහශ්‍ර අභියෝගතා පනතින් ස්ථාපිත වූ ආයතනයකි.

සහස්‍ර අභියෝගතා ගිවිසුම හරහා මූලිකවම පස් අවුරුදු කාලයක් සඳහා වන ව්‍යාපෘති වෙනුවෙන් මූල්‍යාධාර ලබා දෙනු ලබන අතර,

I. ප්‍රවාහන ක්ෂේත්ර ය
II. කෘෂිකර්මාන්තය හා ඉඩම්
III. බලශක්ති හා ජල කලමනා කළමනාකරණය යන ඉසව් වෙත අවධානය යොමු කරනු ලබයි.

එහිදී මූල්‍ය ආධාර ලබාදීමට රාජ්‍යයන් තෝරා ගැනීමේදී දේශපාලනික ආර්ථික හා සමාජීය නිර්ණායක 17 පිළිබඳ එක්ස ආයතනය විසින් සලකා බලනු ලබයි.

MCC ගිවිසුම හරහා ආධාරයක් ලෙස නැවත අයකර ගනු නොලබන ඇමරිකානු ඩොලර් මිලියන 480 (ශ්‍රී ලංකා රුපියල් බිලියන 85ක්) ලංකාවට ලබාදීමට නියමිතව තිබුණි.

## MCC ගිවිසුම හරහා ශ්‍රී ලංකාවට ඇතිවිය හැකි බලපෑම කුමක්ද?

- ගිවිසුම අනුව ශ්‍රී ලංකාවට ලබාදීමට නියමිත ඇමෙරිකානු ඩොලර් මිලියන 480න් ඩොලර් මිලියන 447.5 උපයෝජනය කළ යුතු වන්නේ ඉඩම් ප්‍රතිසංස්කරණය සහ ප්‍රවාහන ක්ෂේත්‍රය ප්‍රතිසංස්කරණය යනු මූලික ව්‍යාපෘති අරමුණු වෙනුවෙන් ය.
- ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය හරහා මෙරට ප්‍රවාහන ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම අරමුණු කර ඇති අතර, මේ යටතේ,

  1) මධ්‍යම වටරවුම් මාර්ගන්ජාලයට (central Ring road network) ඇතුළත් ප්‍රදේශ්වල මාර්ගනවීකරණය කිරීම.
  2) මාර්ග තද බදය කළමනාකරනය කිරීම (Advanced traffic management system)
  3) පොදු බස් රථ සේවාව නවීකරණය කිරීම (bus transport service modernization) යන මූලික ප්‍රතිඵල අත්පත් කර ගැනීමට ඉලක්කගත කර ඇත.

- ගිවිසුම්ගත ව්‍යාපෘතිය තුළ පාරිසරික තිරසර භාවය වෙත අඩු අවධානයක් යොමු කර තිබීම ප්‍රධානතම ගැටලුවකි. ඒ අනුව ව්‍යාපෘතිය යටතේ යෝජිත මධ්‍යම වටරවුම් මාර්ගය නිර්මාණයය කිරීම පාරිසරික වශයෙන් අයහපත් බලපෑම් ඇති කිරීමට නියමිත බව පරිසරවේදීන්න්ගේ මතයයි. මෙම මාර්ග ජාලය මෙරට මධ්‍යම කඳුකරය ආශ්‍රිත පරිසර සංවේදී කලාප හරහා නිර්මාණය කිරීමට යෝජිතය.

- එකඟ ගිවිසුම යටතේ වඩාත් වැඩි අවධානයක් යොමුවී ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය හරහා තෝරාගත් දිස්ත්‍රික්ක 12ක රජයට අයත් සහ අයිතිකරුවන් සහිත ඉඩම් මැන නිසි ඔප්පුවක් නොමැතිව බලපත්‍ර මගින් ඉඩම් අයිතිය ලබාගෙන සිටින පුද්ගලයන්ට නිසි ඔප්පු ලබා දීමත් ඉඩම් ඔප්පු ඩිජිටල්කරණය හරහා වාර්තා පවත්වාගෙ න යාම අපේක්ෂිතය.

## MCC ආධාර මගින් ශ්‍රී ලංකාවට ලැබෙන වාසි.

- බස්නාහිර පළාතේ දැනට පවතින වාහන තදබදය ලිහිල් කිරීම.
- ගමන් පහසුව මගින් ජනයාට වඩාත් පලදායි ලෙස ආර්ථික වර්ධනයට දායක වීමට හැකියාව ලැබීම.
- වෙළඳපොලට ප්‍රවේශ වීමේ හැකියාව වර්ධනය.
- ඒ හේතුවෙන් තම ප්‍රදේශ්වල ජනතාවට තම නිෂ්පාදන පහසුවෙන් අලෙවි කර ගැනීමේට හැකිවීම.
- ඊ- ප්‍රවේශ පත්‍ර මගින් බස් ගාස්තු එකතු කර ගැනීම්ට පහසු වීම.
- ඊ-ඉඩම් ඔප්පු හේතුවෙන් ඉඩම් හිමියන්ට තම ඔව්ප්පු ආරක්ෂිතව තබා ගැනීමට පහසු වීම හා බැංකු ණය අයදුම් කිරීමේදී පහසු වීම.

## MCC ආධාර මගින් ශ්‍රී ලංකාවට ඇති අවාසි.

- ජාතික ආරක්ෂාව වෙනුවෙන් හෝ වෙනත් උපාය මාර්ගික වැදගත්කමක් වෙනුවෙන් රජය භාරයේ පමණක් තිබිය යුතු ඉඩම් තොරතුරු එක් ආයතනයක් සතුවීම.
- බලපත්‍ර යටතේ ගොවීන් විසින් භුක්ති විදිනු ලබන වගා ඉඩම් වල්ට සින්නක්කර ඔප්පු ප්‍රදානය ඉඩම් අහිමි ගොවි පරපුරක් නිර්මාණය කෙරෙන මූලික පියවරක් වීම.
- ජාතික ආරක්ෂාව හා ස්වෛරීත්වයට තිබිය හැකි අවදානම.
- පොදු ප්‍රවාහන මාධ්‍යයක් වූ දුම්රිය පද්ධතිය පිළිබඳ අවධානය යොමු නොවීම.

# කලාපීය වෙළඳ ගිවිසුම්

## I. සප්තා

- 1995) දී ඇතිකරගත් එකඟතාවයකි.
- සාර්ක් කලාපීය රටවල තීරු බදු හා තීරු බදු නොවන වෙළෙඳ බාධක ඉවත් කිරීම තුළින් වෙළෙඳ හා ආර්ථික සහයෝගීතාවය පුළුල් කිරීම අරමුණු කරගෙන සිටී.

- ප්‍රභයස්ථාන නීති (Rules of origin) ලැයිස්තුව මේ සඳහා බාධා වී ඇත.

## II. සෆ්ටා

- 2006 වර්ෂයේ දී අත්සන් කර එක්ගතාවකි.
- සෆ්ටා වලට වඩා වැඩි භාණ්ඩ ප්‍රමාණයක් ඇතුලත් වනු ඇත.
- කලාපයේ සංවර්ධනය වන රටවල් අවුරුදු හයක් තුළ දී තීරු බදු 0% - 5% ත් අතර ප්‍රමාණයකට අඩු කිරීමටත් ඌන සංවර්ධිත රටවල් අවුරුදු 10 කින් තීරුබදු එම මට්ටමට ගෙන ඒමත් එකඟ වී ඇත.

## III. බිම්ස්ටෙක් නිදහස් වෙළෙඳ ගිවිසුම

- 2004 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.
- බෙංගාල බොක්ක ආශ්‍රිත සාමාජික රටවල් වලින් සමන් සමන්විත වේ.
  උදාහරණ: බංගලාදේශය, ඉන්දියාව, මියන්මාරය, නේපාලය, භූතානය, ශ්‍රී ලංකාව හා තායිලන්තය

- විශේෂයෙන් අවධානය යොමු කර ඇති ක්ෂේත්‍ර.
  උදාහරණ: වෙළඳාම හා ආයෝජන, තාක්ෂණය, බලශක්තිය, ජලජ සම්පත්, සංචාරක කර්මාන්තය, ප්‍රවාහනය හා සන්නිවේදනය

## IV. ආසියා - ශාන්තිකර වෙළෙඳ ගිවිසුම

- 2005 ආරම්භ කළ සංවිධානයකි.

සාමාජිකයන් වන්නේ උදාහරණ බංගලාදේශය, ඉන්දියාව, මියන්මාරය, ශ්‍රී ලංකාව, චීනය, පිලිපීනය, දකුණු කොරියාව

## V. තීරයක් සහ මාවතක් ව්‍යාපෘතිය

- තීරයක්හා මාවතක් ව්‍යාපෘතිය ව්‍යාපෘතිය චීනය මගින් ක්‍රියාත්මක කරනු ලබන ගොඩබිමෙන් හා සාගරයෙන් චීනය යුරෝපයට සම්බන්ධ කෙරෙන වෙළෙඳ මාර්ගය වූ ඓතිහාසික සේද මාවත යළි ප්‍රතිනිර්මාණය කිරීමට චීනය විසින් ගනු ලැබූ ප්‍රයන්තය කි.

## ශ්‍රී ලංකාව වෙත ගම්‍ය වන ආර්ථික බල බලපෑම්

- ඓතිහාසික අවධියේ පටන් ශ්‍රී ලංකාව සමුද්‍රීය සේද මාවතේ වැදගත් ස්ථානයක් හිමි කරගෙන සිටින අතර මෙම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ ආයෝජනය, සංචාරක ව්‍යාපාරය, වෙළෙඳාම මත බලපෑම් ඇති කරනු ඇත.
- තීරයක් හා මාවතක් ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා රජය විශාල ප්‍රාග්ධන ව්‍යාපෘති දෙකක් සංවර්ධනය කරනු ලබයි. එනම් හම්බන්තොට වරාය ආශ්‍රිතව ආර්ථික කලාපයේ සංවර්ධනය කෙරෙන අතර කොළඹ වරාය නගරය ආශ්‍රිතව මූල්‍ය හා වාණිජ කටයුතු වර්ධනය කිරීමට අපේක්ෂා කරයි.
- හම්බන්තොට වරාය ආශ්‍රිත කාර්මික කලාපයට විශාල ආයෝජකයක් චීනයෙන් අපේක්ෂා කරන අතර එමගින් සේවා නියුක්තිය රාජ්‍ය බදු ආදායම ප්‍රාදේශීය සංවර්ධනය යන අංශ වලට ප්‍රතිලාභ සැලසීම.
- මෙම ව්‍යාපෘතියේ විවිධ අදියරයන්හි ඉදිකිරීම් සඳහා සහ යටිතල පහසුකම් සැපයීමට ශ්‍රී ලංකාවේ සමාගම් වලට සහභාගි වීමට අවස්ථාව උදාවනු ඇත.
- ගෝලීය වටිනාකම් ජාලයට සම්බන්ධ වීමට හැකි වීම. සමුද්‍රීය සම්පත් ගවේෂණය තාක්ෂණය, හා දැනුම් හුවමාරුව, රැකියා උත්පාදනය වැනි අංශ වර්ධනය වීම.
- 2010 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ගේ ප්‍රමාණය ඉහළ යාම හරහා සංචාරක ව්‍යාපාරය සංවර්ධනය වීම.

## පාස්කු ඉරුදින ප්‍රහාරය නිසා සේවා අංශයට සිදු වූ සිදු වූ බලපෑම

- වර්ධන වේගයක් පෙන්නුම් කළ ආර්ථිකය පුනර්ජීවනය කිරීමයි.
- එසේ වෙතත් covid - 19 වසංගතය පැතිරීම හා වසංගතය පැතිරීම වැළැක්වීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග හමුවේ ආර්ථිකයේ සියලුම පාර්ශ්කරුවන් මෙන්ම ආර්ථිකය යළි යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලිය ද දැඩි දුෂ්කරතාවලට මුහුණ දුන්නේ ය.